විවෘත සහ දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය

Centre for Open and Distance Learning
University of Kelaniya-Sri Lanka

# ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2007

## සිංහල - SINH - E1025

## චිරන්තන සිංහල ගද්‍ය පද්‍ය සාහිත්‍ය හා භාෂා ප්‍රවේශය

පළමුවන ප්‍රශ්නය ද, දෙවන හා තෙවන කොටස්වලින් ප්‍රශ්න දෙක (02) බැගින් ද තෝරා ගෙන ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි | කාලය : පැය 03 යි

---

## 1 කොටස

01. අ) පහත දැක්වෙන ඡේදය ලිහිල් බසින් ලියා ඊට අදාළ අවස්ථා සම්බන්ධය දක්වන්න.

ඉක්බිත්තෙන් මෙසේ විචාළ රජ්ජුරුවනට, ''ඇසුව මැනැව, දේවයන් වහන්සැ'' යි ගාථයෙකින්, ''ස්ථානාන්තරාදි කිසි ලාභ සම්පත්තියක් ලදින් ම, 'මේ උතුමැ'යි සිතන්නා වූ අඥාන තෙමේ පාණාතිපාතාදි පාප ධර්මයන් කරන්නේ ය. එසේ හෙයින් මේ ලොව බලන්නේ ඓශ්වර්ය මදයෙන් ප්‍රමාද වැ කළා වූ පාප කර්ම බලයෙන් නරකාදියෙහි අනන්ත දුඃඛයට භාග් වන්නේ ය. මෙසේ උපේක්ෂාපූර්වාංගම වූ චින්තාවක් නැති වැ පරලොව නොබලන්නේ දෙ ලොවෙහි ම හෙවත් ඉසුරු මදයෙන් පව් කොට නරකාදියෙහි උපදනේ පර ලොවැ ද, නැවැත එයින් ච්‍යුත වැ දිළිඳු කුලයෙහි නොයෙක් දුකට භාජන වැ උපදනේ මේ ලොවැදැ යි, මෙසේ දෙ ලොවෙහි ම නුවණ නැති තැනැත්තේ පරාජයක් ගන්නේ ය; හෙවත් විනාශයට පැමිණෙන්නේ ය. මේ කාරණය දැක මම, 'නුවණැත්තේ ම උතුමැ; යසසින් යුක්ත වූ නුවණ නැති තැනැත්තේ උතුම් නො වෙයි' කියමැ''යි වදාළ සේක. මෙසේ බෝසතාණන් වහන්සේ විසින් වදාළ කල්හි රජ්ජුරුවෝ සේනකයන් මූණ බලා ''මහෞෂධ පණ්ඩිතයෝ නුවණැත්තා වූ ම උතුමැ' යි කියති. කෙබඳු ද, ආචාරිනි''යි කීහ. සේනකයෝ, ''දේවයන් වහන්ස, මහෞෂධ පණ්ඩිතයෝ ළදරුවෝ ය. අද දක්වාත් උන් ගේ මුඛය කිරි සුවඳ අමයි. මේ බාල දරුවෝ කුමක් දනිද්දැ''යි කියා ගාථායෙකින් කාරණයක් දක්වන්නාහු, ''මේ ශිල්ප තෙමේ හෙවත් නුවණ තෙමේ ධන ධාන්‍යාදි වූ භෝග සම්පත් සිද්ධ නොකරන්නේ ය. පුත්‍රදාරාදි වූ නෑයෝ ද රූප සම්පත්තිය ද ධනධාන්‍යාදි වූ සම්පත් ද සිද්ධ නොකරන්නාහ. ඊට දෘෂ්ටාන්ත කවරේදැ යි යත හොත් :
කෙළ තොලු වැ හෙවත් අනවරතයෙන් දෙකොළින් බස්නා කෙළ ධාරා ඇති රූප සම්පත්තියක් නැති හස්ත්‍යශ්වාදි පරිවාරයෙන් හා ධනධාන්‍යාදි සම්පත්තීන් යුක්ත වැ සුව විඳිනා මේ ගෝරිමන්ද නම් සිටුහු ශ්‍රී කාන්තා සෙවුනී ය.

(ලිහිල් බසින් ලිවීම ලකුණු 06
අවස්ථා සම්බන්ධය ලකුණු 04)

ආ) පහත සඳහන් පද්‍ය පන්තිය ලිහිල් බසින් ලියා රසාස්වාදය කරන්න.

හිමකර සිනිඳු සොමි රැස් රැස් කරනුව ට
තිලකර කෙතෙයි ඉසි බිජුවට තිසි ලෙස ට
එකවර දිලෙන දිගු දලු ලන ලෙස රැව ට
මම්තුර පෙනෙයි බබළන තරුවැළද ත ට

මදනල සබඳ සඳවෙල ගිනිදැල් නොම ඳ
වැද වැද පිපිර හුණු තුරු බිජු මෙන් එ ස ඳ
රොද බැඳ රොනැර ගෙන යන බමර මුළු වැ ද
කොඳ වන පිපෙන රඟ බල හැම තැන සබ ඳ

ලොලව වන දනන් ලේ බීමෙන් නො ම ඳ
ර තු ව ගියේ දෝ සත සැක කරන ල ද
ම තු ව උදා සිරසෙන් පෙනෙන එම ස ඳ
බ ල ව සඳ වෙලෙන් රතු වූ සුපුන් ස ඳ

නව යොවුනන් වුවනට කිපි සිසිර කර
උන් හිමියන් වෙන් වන තැන දුන' වස ර
මත කොවුලන් වෙත ලන රහස යටියු ර
තුරු සිදු රෙන් එන සඳරැස් බල මිතුර

සුනෙර මතින් අලළන සඳ කිරි සයු ර
ඉ ති ර වෙරළ දිව යන මෙන් රළ පත ර
පැති ර උදය ගිරි සිරසින් දිලි නොහැ ර
මි තු ර බලා ලව එන සඳරැස් වතු ර

(ලිහිල් බසින් ලිවීම ලකුණු 05
රසාස්වාදය ලකුණු 05)

## 11 කොටස

02. 'උම්මග්ග ජාතකය උසස් සාහිත්‍ය නිර්මාණයක් වශයෙන් අගය කළ නොහේ.' මේ පිළිබඳ ඔබේ අදහස් දක්වන්න. (ලකුණු 20)

03. ස්වභාව සෞන්දර්ය වර්ණනා විෂයෙහි හංස සන්දේශ කවියා දක්වූ සාමර්ථ්‍යය සනිදර්ශනව පහදන්න.

නැතහොත්

හංස සන්දේශයෙහි දිය කෙළි වැනුම ගැන ඇගයීමක් කරන්න.
(ලකුණු 20)

04. කුරුණෑගල සාහිත්‍ය යුගයේ විද්‍යමාන වන විශේෂ ලක්‍ෂණ පිළිබඳ විමර්ශනයක් කරන්න. (ලකුණු 20)

05. ගම්පළ යුගය සිංහල සාහිත්‍යයෙහි කැපී පෙනෙන්නේ කවර හේතු සාධක මතදැ'යි පහදන්න. (ලකුණු 20)

06. සිංහල පද්‍ය සාහිත්‍ය වංශයෙහි ස්වර්ණමය යුගය ලෙස කෝට්ටේ අවධිය හැඳින්වීම කොතෙක් දුරට යුක්ති යුත්ත වේදැ'යි විමසන්න. (ලකුණු 20)

## 111 කොටස

07. භාෂාව යනු කුමක්දැ'යි විස්තර කොට සමාජ අවශ්‍යතා සම්පූර්ණ කර ගැනීමෙහි ලා භාෂාවේ කාර්යභාරය පහදන්න. (ලකුණු 20)

08. වර්තමාන ලිඛිත සිංහල අක්‍ෂර මාලාව කථිත (භාෂණ) සිංහල අක්‍ෂර මාලාවෙන් වෙනස් වන ආකාරය පිළිබඳ විමර්ශනය කරන්න. (ලකුණු 20)

09. ප්‍රාදේශීය උපභාෂා හා ප්‍රාස්තාවික භාෂා අතර වෙනස නිදසුන් දෙමින් පැහැදිලි කරන්න. (ලකුණු 20)

10. පහත සඳහන් මාතෘකාවලින් හතරක් (04) පිළිබඳ කෙටි සටහන් ලියන්න.

1. ස්ථාන හා කරණ
2. ඝෝෂ - අඝෝෂ භේදය
3. ෂට් කාරක
4. ස්පර්ශ නාසික්‍ය හා අස්පර්ශ නාසික්‍ය
5. ආවස්ථික නිපාත ක්‍රියා
6. පූර්ව නාසික්‍ය ව්‍යඤ්ජන
7. සන්ධි වීම හා සන්ධි කිරීම
8. සමාජීය උපභාෂා හා පරිමිත භාෂා

(ලකුණු 20)

******************************